ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

**<u>පුවත්පත් නිවේදනය</u>**

## <u>නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා විසින් පවත්වන ලද සාකච්ඡා</u>

2021 පෙබරවාරි 02 වන දින නියෝජ්‍ය ඉන්දීය මහ කොමසාරිස් විනෝද් කේ. ජේකබ් මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රී සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් (පිල්ලෙයාන්) මැතිතුමා සහ විනයාගමූර්ති මුරලිදරන් (කරුණා අම්මාන්) මැතිතුමා විසින් ප්‍රධානත්වය ගත් නැගෙනහිර පළාතේ නියෝජිතයන් කණ්ඩායම් දෙකක් වෙන් වෙන් වශයෙන් හමු විය . මෙම හමු දෙකෙහිදී ම නියෝජ්‍ය මහ කොමසාරිස් ජේකබ් මැතිතුමා ශ්‍රී ලංකාව සමඟ දිගු කාලීන සංවර්ධන සහයෝගීතාවයක් උදෙසා ඉන්දියාවේ කැපවීම අවධාරණය කළේය. නියෝජ්‍ය මහ කොමසාරිස් ජේකබ් මැතිතුමා සහ සිවනේසතුරෙයි චන්ද් රකාන්තන් මැතිතුමා 13 වන ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන්ම ක් රියාත්මක කිරීම සහ පළාත් සභා පිළිබඳව ද සාකච්ඡා කළහ.

විනයාගමූර්ති මුරලිදරන් මැතිතුමා විශේෂයෙන්ම යුද්ධයෙන් වැන්දඹු වූ කාන්තාවන්ට සහ ආබාධිත වූවන්ට ජීවනෝපාය අවස්ථා ලබා දීම සහ ශිෂ් යත්ව ලබා දීම ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයට දායකත්වය ලබා දීම වැනි අංශයන් තුළ අනාගත සංවර්ධනයට පවතින අවස්ථා පිළිබඳව සඳහන් කළේය. 13 වන ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සහ පළාත් සභා තුළින් දමිළ ජනතාවගේ අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීම උදෙසා විසඳුම අර්ථවත් ලෙස බලය බෙදීම වන බවට ඉන්දීය රජය දරන ස්ථාවරය නියෝජ්‍ය මහ කොමසාරිස්තුමා මෙහිදී අවධාරණය කළේය.

***

*කොළඹ*

*2021 පෙබරවාරි 02*